අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/11/01/01/රාජ්‍ය වෙසක්
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2021-05-17

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්,
සියලුම පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලා,
සියලුම ගුරුවිද්‍යාල විදුහල්පතිවරුන්,
සියලුම විදුහල්පතිවරුන්,

**ශ්‍රී බුද්ධ වර්ෂ 2565 (ව්‍යවහාර වර්ෂ 2021) වෙනි වෙසක් පොහොය නිමිත්තෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිත විශේෂ වෙසක් සතිය වැඩසටහන**

**තේමාව - "සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා - සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා!"**

බුදුරජාණන් වහන්සේගේ උතුම් තෙමඟුල සමරණ ශ්‍රී බුද්ධ වර්ෂ 2565 වෙනි වෙසක් පොහොය නිමිත්තෙන් 2021 මැයි මස 23 වන දා සිට 2021 මැයි මස 29 වන දින දක්වා (දෙදිනම ඇතුළත්ව) වෙසක් සතිය වැඩසටහන පැවැත්වේ.

පවත්නා කෝවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ පාසල් නොපැවැත්වෙන හෙයින් වෙනදා මෙන් මෙවර වෙසක් උත්සවය උදෙසා පාසල්වල විශේෂ ආගමික වැඩසටහන් පැවැත්වීමට නොහැකි වී ඇති බැවින් නිවෙස්වල සිට වෙසක් උත්සවය සැමරීමට දෙමාපියන් මඟින් සිසුන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

ඒ සඳහා මේ සමඟ ඉදිරිපත් කර ඇති යෝජිත වැඩසටහන හෝ වෙනත් සුදුසු ආගමික වැඩසටහන් සඳහා සිසුන් යොමු කිරීමට කටයුතු කරන මෙන් දන්වන අතර මේ පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම සඳහා මාර්ගගත ක්‍රමවේදය හෝ වෙනත් සුදුසු ක්‍රමවේදයක් යොදා ගන්නා මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

මේ සම්බන්ධයෙන් ඔබෙන් ලැබෙන සහය කෘතඥතා පූර්වකව අගයමි.

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் +94112784832 +94112784825
ලේකම් / செயலாளர் +94112784811 +94112785162

| දිනය | තේමාව | යෝජිත ක්‍රියාකාරකම් |
| --- | --- | --- |
| මැයි මස 23 | "නිරසාර පරිසරයක් සඳහා බුදුදහම" | නිවසේ බුදුන් වඩින ස්ථානය, නිවස සහ නිවස අවට හොඳින් පවිත්‍ර කර නිවසේ සියලු දෙනා එක්ව උදේ හා සවස බුද්ධ වන්දනාවේ යෙදී රතන සූත්‍රය සජ්ඣායනා කර සෑමට සෙත් පැතීම සඳහා සිසුන් යොමු කිරීමට දෙමාපියන් දැනුවත් කරන්න. |
| මැයි මස 24 හා 25 දෙදින | "බුදුදහමින් පෝෂිත වූ හෙළ කලාව" | නිවසේ තිබෙන සහ අවටින් සොයා ගත හැකි අමු ද්‍රව්‍ය භාවිත කර වැඩිහිටියන්ගේ මඟ පෙන්වීම මත වෙසක් පහන් කූඩු තැනීම, වෙසක් පත් නිර්මාණය කිරීම හා සුදුසු පරිදි වෙසක් සැරසිලි කිරීම සඳහා සිසුන් යොමු කිරීමට දෙමාපියන් දැනුවත් කරන්න. |
| මැයි මස 26 හා 27 දෙදින | "ප්‍රතිපත්ති හා ආමිස පූජාවෙන් පෝෂිත බුදුදහම" | නිවසේ වැඩිහිටියන් සමඟ එක්ව උපෝෂථ සීලය සමාදන්ව ධර්මශ්‍රවණය කරමින්, භාවනා වඩමින් ප්‍රතිපත්ති පූජාවේ නිරත වීම සවස් කාලයේ වෙසක් පහන්කූඩු ආදිය දල්වමින් ආමිස පූජාවේ නිරත වීම ආදිය සඳහා සිසුන් යොමු කිරීමට දෙමාපියන් දැනුවත් කරන්න. |
| මැයි මස 28 | "පරෝපකාරය හුරුවූ බොදු දරුවා" | නිවසේ සිටින වැඩිහිටියන්ට උපස්ථාන කිරීම, සතුන්ට ආහාරපාන ආදිය ලබා දීමට සිසුන් යොමු කිරීමට දෙමාපියන් දැනුවත් කරන්න. |
| මැයි මස 29 | "බුදුදහම පදනම් කර ගත් ශිෂ්‍ය ජීවිතය" | බුදුරජාණන් වහන්සේගේ උතුම් තෙමඟුල යෙදුණු වෙසක් සතිය සමරමින් සිසුන් කටයුතු කළ ආකාරය විදහා දැක්වීම සඳහා වාර්තා, කවි, චිත්‍ර ආදී නිර්මාණ කිරීම සඳහා සිසුන් යොමු කිරීමට දෙමාපියන් දැනුවත් කරන්න. |

පවත්නා කෝවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ සිසුන්ගේ ආරක්ෂාවට ප්‍රමුඛතාව දී කටයුතු කළ යුතු බව ද අවධාරණය කරන ලෙස කාරුණිකව දන්වමි.

මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. ලේකම් - බුද්ධ ශාසන අමාත්‍යාංශය
3. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය
4. විභාග කොමසාරිස් ජනරාල්
5. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
6. ප්‍රධාන කොමසාරිස් - ගුරු අධ්‍යාපන පරිපාලන
7. අධ්‍යක්ෂ (ජාතික පාසල්)
8. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ශාඛාභාර මාණ්ඩලික නිලධාරීන්

} කරු. දැ.ගැ.ස සහ අ.ක.ස.